# ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය උදෙසා ධීවර කර්මාන්තයේ දායකත්වය පිළිබඳ අධ්‍යයනය

කේ.ඒ.ඩී.යූ. පෙරේරා[1]

**සංක්ෂේපය**

අතීතයේ පටන් ශ්‍රී ලංකාව තුළ කරගෙන එන්නා වූ කර්මාන්ත අතරින් ප්‍රධාන තැනක් ධීවර කර්මාන්තයට ද හිමි වේ. එය රටේ බොහොමයක් වෙරළාශ්‍රිත ජනතාවගේ ප්‍රධාන ජීවන වෘත්තිය බවට ද පත් වී ඇත. ධීවර කර්මාන්තය පිළිබඳ සලකා බැලීමේදී එය ඉතා පුළුල් පරාසයක් ඔස්සේ සාකච්ඡා කළ හැකි එකක් වුවත් මෙහි දී එහි ආර්ථික පසුබිම පිළිබඳ වැඩි අවධානය යොමු කර ඇත. ඒ අනුව කර්මාන්තයේ පසුබිම, ගෝලීය වශයෙන් පවතින තත්ත්වය, දළ දේශීය නිෂ්පාදිතයට ලැබෙන දායකත්වය, සේවා නියුක්තිය, වෙළෙඳපොළ හා ඒ ආශ්‍රිත ගැටළු පිළිබඳව අවධානය යොමු කරමින්, මෙම අධ්‍යයනය සිදු කෙරුණි. ඒ සඳහා පොත් පත්, ආයතනික සංඛ්‍යා ලේඛණ ආදී මූලාශ්‍ර යොදා ගනු ලැබූ අතර ඒ අනුව පෙනී යන්නේ කර්මාන්තයේ පවතින මන්දගාමී වර්ධනය කෙරෙහි දැනට ලැබෙන රාජ්‍ය අවධානය තව තවත් වැඩි විය යුතු බවයි. මිනිස් සිරුරට අත්‍යවශ්‍ය ප්‍රෝටීන කොටස් ලබා ගත හැකි පහසුම මාධ්‍යයක් වන මසුන් සඳහා සංවර්ධනය වන රටක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ ඇත්තේ ද සැලකිය යුතු ඉල්ලුමකි. චීනය, නෝර්වේ රාජ්‍යය, ප්‍රංශය, ඇමරිකාව වැනි ලෝකයේ ඉතා දියුණු රටවල් පවා මත්ස්‍ය කර්මාන්තය තම රටවල් වල සංවර්ධන ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා බව මෙහිදී පෙනී යයි. ශ්‍රී ලංකාවේ ද මත්ස්‍ය අස්වැන්නෙන් වැඩි ප්‍රතිශතයක් වෙන් කෙරෙන්නේ පරිභෝජනයට යි. නමුත් සාගර සම්පත හා අභ්‍යන්තර වැව් ආදිය උපයෝජනයේ මඳ බවක් තව දුරටත් පෙනීයයි.

**මුඛ්‍ය පදඃ** ධීවර කර්මාන්තය, මත්ස්‍ය නිෂ්පාදනය

**හැඳින්වීම**

ධීවරයින් යනු ජලයෙන් මාළු හා වෙනත් ජීවීන් අල්ලා ගෙන තම ජීවිකාව කරගෙන යන්නෝ වෙති. මෙහි ජලය නමින් අදහස් වන්නේ සාගර, කලපු හා ගොඩබිම් ආදී ජල මූලාශ්‍ර වේ. මිනිසා තම ආහාර සඳහා මසුන් ඇල්ලීමට පටන් ගත් දා සිට ධීවර කටයුතු ආරම්භ වූවා යැයි සැලකේ. ගල් යුගයේ පටන්ම මානවයා තම ආහාර සඳහා මසුන් යොදා ගත් බවට මූලාශ්‍ර පවතී. පුරා විද්‍යාත්මක ගවේෂණ වලින් හමු වූ මත්ස්‍ය ඇටකටු, බෙල්ලන්ගේ කටු, සත්ව ඇටකටු වලින් සාදන ලද බිලී කොකු හා ඔවුන් විසින් අඳින ලද චිත්‍ර ඒ බව සනාථ කරනු ලබයි.

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථික විද්‍යා පළමු වසර,senaliperera826@gmail.com

ගල් යුගයේ සිට විසි එක් වන සියවස දක්වා කාලය සලකා බැලීමේදී, මුල් යුග වලදී මෙය කර්මාන්තයක් ලෙස ක්‍රියාත්මක නොවුනත් මේ වන විට එය ලෝකයේ ඉතා දැවැන්ත කර්මාන්තයක් බවට පරිවර්තනය වී ඇත. ඒ එන ගමනේදී මේ කාල පරිච්ඡේදය තුල අනෙකුත් කර්මාන්ත වලට මෙන්ම ධීවර කර්මාන්තයටද ලෝකයේ සිදු වූ බොහෝ සිද්ධීන්ට මුහුණ දීමට සිදු විය. එහිදී ලෝක යුද්ධ වැනි තත්ව හමුවේ එය පසුගාමී තත්වයකුත්, විද්‍යාව හා තාක්ෂණය වැනි අංශ වල වර්ධනය සමග ප්‍රගතිදායී තත්වයකුත් දක්නට ලැබීය.

වර්තමානය වන විට ලෝක ජනගහනයෙන් මිලියන 38ක පමණ වාණිජ හා යැපුම් අරමුණු වලින් මසුන් වගා කරන ධීවර ප්‍රජාවක් වෙසෙයි. ලෝක ජනගහනයේ වර්ධනයත් සමඟ ලෝක මාළු නිෂ්පාදිතයේ ඉල්ලුමද වැඩි වූ අතර ඒ අනුව මාළු නිෂ්පාදනයද ඉහල ගොස් ඇත. ගෝලීය ජනගහනයෙන් බිලියන 3.1කට වඩා අධික ජනතාවක් හෙවත් 20%ක ප්‍රමාණයක් තම සාමාන්‍ය ඒක පුද්ගල ෂත්ව ප්‍රෝටීන අවශ්‍යතාව සඳහා මසුන් භාවිතා කරයි. පහසුවෙන් සපයා ගත හැකි, ඉතා ඉහළ ප්‍රෝටීන් ගුණයකින් යුක්ත වන මසුන් තුල අත්‍යවශ්‍ය මේදය, විටමින් ඩී, ඒ හා බී, කැල්සියම්, යකඩ, සින්ක්, අයඩීන් හා සෙලිනියම් වැනි පෝෂක කොටස් ඇතුලත් වේ. මෙවැනි ඉහල වටිනාකමක් තුල මත්ස්‍ය නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් ලෝක වෙළඳපොළ තුළ ඇති වී ඇත.

**ලෝකයේ ධීවර කර්මාන්තය**

අන්තර්ජාතික වශයෙන් සලකා බැලමේදී සමස්ථ ලෝකයේම මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදනය 2014 දී මෙට්‍රික් ටොන් මිලියන 167.2ක් විය. එය අල්ලා ගන්නා මසුන්ගෙන් මෙට්‍රික් ටොන් මිලියන 93.4ක් හා ජලජීවී වගාවෙන් මෙට්‍රික් ටොන් මිලියන 73.8ක් විය. එහි මානව පරිභෝජනයට වෙන් කරන කොටස මෙට්‍රික් ටොන් 146.3 ක් වන අතර බිලියන 7.3ක් වූ ලෝක ජනගහනයේ ඒක පුද්ගල මත්ස්‍ය සැපයුම කිලෝ ග්‍රෑම් 20.1ක් වූ බව එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකාර්මික සංවිධානය ප්‍රකාශ කරනු ලැබීය.

මෙම සංවිධානයට අනුව ලෝක කරදිය මත්ස්‍ය නිෂ්පාදනයේ ඉහලම අගයක් වාර්තා කරන්නේ චීනයයි. එය 2014දී මෙට්‍රික් ටොන් 14,811,390 ක් විය. ඉන්දුනීසියාව, ඇමරිකාව, රුසියාව, ජපානය පිළිවෙලින් එහි මීළග ස්ථාන හිමි කර ගන්නා අතර අසල්වැසි ඉන්දියාව එහි 7 වන ස්ථානය හිමි කර ගනී. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයෙන් ද ලොව ප්‍රථම ස්ථානය හිමි කර ගන්නේ චීනයයි. එය 2014 දී මෙට්‍රික් ටොන් 2,295,157ක් විය. එහි මීළග ස්ථාන පිළිවෙලින් මියන්මාරය, ඉන්දියාව, බංගලාදේශය, කාම්බෝජය යන රටවල් හිමි කර ගනී. එසේම ප්‍රාදේශීය වශයෙන් සලකා බැලීමේදී ලෝක මුළු මත්ස්‍ය නිෂ්පාදනයට ඉහලම දායකත්වය ලබා දෙන්නේ ආසියාවයි. එය 2014 දී මෙට්‍රික් ටොන් 65601.9ක් වූ අතර මුළු නිෂ්පාදනයෙන් 88.91% ක් විය. ඇමරිකාව 4.54% ක දායකත්වයක් ද යුරෝපය 3.97% ක දායකත්වයක් ද ලබා දෙමින් පිළිවෙලින් දෙවන හා තෙවන ස්ථාන හිමි කර ගෙන සිටී.

2014 වර්ෂය වන විට ලෝකයේ ධීවරයින් හා ධීවර කර්මාන්තය ආශ්‍රිත වගා කරුවන් 56,632,000ක් සිටින අතර ඉන් බහුතරම අගය 47,730,000ක් ලෙස වාර්තා කරන්නේ ආසියා මහද්වීපයයි. ලෝකයේ මත්ස්‍ය අපනයන සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී ඉහලම මත්ස්‍ය අපනයන පිළිවෙලින් චීනය, නෝර්වේ රාජ්‍යය, වියට්නාමය, තායිලන්තය, ඇමරිකාව යන රටවල් හිමි කර ගනී. ලොව හොඳම මත්ස්‍ය ආනයන කරුවා ඇමරිකාව යන අතර එහි මීළඟ ස්ථාන පිළිවෙලින් ජපානය, චීනය, ස්පාඤ්ඤය, ප්‍රංශය හිමි කර ගනී.

**ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය**

මුහුදෙන් වට වූ ගොඩබිමක් වු ශ්‍රී ලංකාව, රට වට කොට ගත් මහා සාගරය හා රට අභ්‍යන්තරයේ වූ වැව්, ගංගා ආදිය මූලාශ්‍ර කොට ගෙන තම ධීවර කටයුතු පවත්වා ගෙන යයි. එහිදී භාවිතා කරන ජල මූලාශ්‍රය අනුව ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ප්‍රධාන කොටස් තුනකට බෙදේ.

- මිරිදිය ධීවර කර්මාන්තය
- කරදිය ධීවර කර්මාන්තය
- කිවුල්දිය ධීවර කර්මාන්තය

මිරිදිය ධීවර කර්මාන්තය යටතට ගැනෙන්නේ රට අභ්‍යන්තරයේ වූ වර්ග කිලෝමීටර 1400ක පමණ වපසරියකින් යුත් වැව්, ගංගා මූලික කර ගනිමින් සිදු කරන ධීවර කටයුතු වේ. තිලාපියා, ලූලා, කොරලි, පෙතියා, කනයා, හුංගා, මඟුරා, ආඳා, මහවලයා, හිරිකනයා ආදී මසුන් මෙහිදී නිෂ්පාදනය කරනු ලැබේ. මසුන් බෝ කිරීමේ මධ්‍යස්ථාන දඹුල්ල, උඩවලව ආදී ප්‍රදේශ වල පවත්වා ගෙන යන අතර මේ සම්පූර්ණ මාළු නිෂ්පාදනයම රට අභ්‍යන්තර පරිභෝජනය සඳහා භාවිතා කෙරේ. මිරිදිය මත්ස්‍යයන්ගේ ඇති ඉහල ගුණාත්මක බව හා රසවත් බව නිසාම දේශීය වෙළඳපොළ තුල ඒ සඳහා ඉහල ඉල්ලුමක් නිර්මාණය වී ඇත.

කිවුල්දිය මත්ස්‍ය කර්මාන්තය යටතට ගැනෙන්නේ කලපු, මෝය, කඩොල් වගුරු, ලවණ වගුරු ආශ්‍රිතව සිදු කෙරෙන ඉස්සන්, පොකිරිස්සන්, බෙල්ලන්, කකුළුවන්, විසිතුරු මසුන් ආදී නිෂ්පාදන ඉලක්ක කර ගත් ධීවර කර්මාන්තයයි. ඉස්සන් වගාවට හලාවත, පුත්තලම ආශ්‍රිත වෙරළ තීරය ප්‍රසිද්ධියක් උසුලන අතර මේ යටතට ගැනෙන මත්ස්‍ය අස්වැන්න රට අභ්‍යන්තර පරිභෝජනයට මෙන්ම අපනයන සඳහා ද වෙන් කෙරෙනු ලැබේ.

කරදිය ධීවර කර්මාන්තය වෙරළාසන්න, නොගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය හා ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය ලෙස ආකාර දෙකකි. එහිදී වෙරළාසන්න හා නොගැඹුරු මුහුදේ ධීවර කටයුතු පවතින්නේ මහද්වීපික තටකයට (Continental Shelf) අයත් කලාපයේය. මෙය මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් 90%ක් පමණ වේ. බොහෝ විට පැය විසි හතර තුල සිදු කරන ධීවර කටයුතු ලෙස මේවා හැඳින්විය හැක. මෙහිදී අල්ලා ගන්නා මසුන් වන්නේ හාල්මැස්සා, සූඩයා, හුරුල්ලා, රන්නා,

කොස්සා, දැල්ලා ආදීන් වන අතර මෙම සම්පූර්ණ නිෂ්පාදනයම රටේ අභ්‍යන්තර පරිභෝජනයට වෙන් කෙරේ.

ගැඹුරු මුහුදෙහි ධීවර කටයුතු සිදූ වන්නේ මහද්වීපික තටකයෙන් ඔබ්බෙහි අනන්‍ය ආර්ථික කලාපයෙහි (Exclusive Economic Zone) වේ. මෙම ධීවර කටයුතු වලදී ගැඹුරු මුහුදේ දිනකට වඩා කාලය ගත කල යුතු වන අතර මෙය බහුදින ධීවර කර්මාන්තය වශයෙන් ද හැඳින්වේ. මෙහිදී කෙලවල්ලා, බලයා, ඇටවල්ලා, තලපත්, අලගොඩුවා, කුම්බලාවා, කොප්පරා, තෝරා, මෝරා ආදී මසුන් නිෂ්පාදනය කරයි. එය රටේ අභ්‍යන්තර පරිභෝජනයට මෙන්ම අපනයන සඳහා ද වෙන් කරනු ලැබේ. ප්‍රධාන ධීවර ආම්පන්න ලෙස ලොකු සිදුරු සහිත පාවෙන කරමල් දැල් හා මෝර මරුවැල් යොදා ගනී.

ඉහත කී ප්‍රධාන ධීවර කාර්මික නිෂ්පාදන වලට අමතරව මුතු බෙල්ලන්, හක් බෙල්ලන්, මුහුදු කැකිරි හා මුහුදු කුඩැල්ලන් ඇල්ලීම මන්නාරම හා යාපනය යන දිස්ත්‍රික්ක වල සිදු කෙරේ. මේවා අපනයනය කිරීම ඉලක්ක කරගෙන සිදු කෙරෙන අතර චීනය ප්‍රධාන ගැනුම්කරු වේ.

**ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ධීවර කර්මාන්තයේ දායකත්වය**

**ආනයන අපනයන හා මත්ස්‍ය වෙළෙඳපොළ**

යම් කර්මාන්තයක වෙළඳපොළ යනු එම කර්මාන්තයට වටිනාකමක් ලබා දෙන ස්ථානය වේ. 2015 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකාවේ මුළු කරදිය මත්ස්‍ය .නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 452,890ක් වූ අතර මුළු මිරිදිය මත්සය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 67,300ක් විය.

මුහුදෙන් නෙලා ගන්නා අස්වැන්න වෙරළට ගෙන ආ පසු වෙරළට රැස් වෙන අතරමැදියන්, අපනයන ආයතන වල නියෝජිතයන් විසින් එය මිලදී ගන්නා අතර ඉන් අනතුරුව ප්‍රධාන මත්ස්‍ය අලෙවිසැල් වලදී ඒවා තොග හා සිල්ලර ලෙස අලෙවි කරයි. බොහෝ විට එක් මසුන් අල්ලන බෝට්ටුවකින් ඉතා විශාල මත්ස්‍ය ප්‍රමාණයක් සැපයීම අපේක්ෂා කල නොහැක. එම නිසා ගැනුම්කරුවන්ට එක් එක් බෝට්ටුවලින් රැගෙන එන මසුන් වෙන් වෙන්ව මිලදී ගැනීමට සිදු වී ඇත.

ශ්‍රී ලංකාවේ බේරුවල, මිරිස්ස, හලාවත, මීගමුව, කොළඹ, ගාල්ල, තංගල්ල, කිරින්ද, මයිලිඩ්ඩි, ත්‍රිකුණාමලය ආදී වරායන් ධීවර වරායන් ලෙසද, මසුන් ගොඩබාන ස්ථාන ලෙස පේසාලේ, මන්නාරම, කල්පිටිය, පුත්තලම, මොරටුව, බලපිටිය, වැලිගම, දෙවුන්දර, හම්බන්තොට, කල්මුනෙයි, මඩකලපුව, කෝකිලායි, මුලතිවු වැනි ස්ථාන ද හඳුනාගත හැක.

ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන කරදිය මත්ස්‍ය නිෂ්පාදනයෙන් ඉස්සන්, පොකිරිස්සන්, මෝර වරල්, කකුළුවන් ආදී මත්ස්‍ය නිෂ්පාදන අපනයන වෙළඳපොළ සඳහා යොමු කෙරේ. එහිදී චීනයට සිදු කෙරෙන අපනයන ප්‍රධාන තැනක් ගනී. ඒ අනුව 2015 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ මුළු මත්ස්‍ය අපනයන, මෙට්‍රික් ටොන්

17,461 ක් ලෙස ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය වාර්තා කරයි. එය 2014 දී මෙට්‍රික් ටොන් 26,320 ක් වූ අතර ප්‍රතිශතයක් වශයෙන් -33.7ක අඩු වීමක් පෙන්වයි. එසේ වීමට හේතු වී ඇත්තේ ශ්‍රී ලංකාව අත්සන් කල ඇතැම් ගිවිසුම් වල ප්‍රතිඵලයක් ලෙස 2015 ජනවාරි මස සිට යුරෝපා සංගමය තුල පවතින රටවල් වැනි වැදගත්ම වෙළඳපොළ වෙත මාළු අපනයනය කිරීමේ අයිතිය අහිමි වීමයි.

වගුව 01: මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන අපනයන ප්‍රමාණ (මෙට්‍රික් ටොන්)

| ද්‍රව්‍ය | 2012 | 2013 | 2014 | 2015 | වෙනස % 2014/2015 | මුළු ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| ජීවී මසුන් | - | - | - | - | - | - |
| ඉස්සන් | 1,078 | 1,625 | 2,001 | 1,341 | -33 | 7.70% |
| පොකිරිස්සන් | 119 | 340 | 301 | 204 | -32 | 1.20% |
| කකුළුවන් | 1,557 | 1,861 | 1.872 | 1,710 | -8.7 | 9.80% |
| බෙල්ලන් | 255 | 260 | 165 | 169 | 2.9 | 1.00% |
| වෙනත් මුහුදු ජීවීන් | 1,642 | 2,064 | 2,431 | 1,371 | -43.6 | 7.90% |
| මෝර වරල් | 56 | 34 | 32 | 39 | 20.8 | 0.20% |
| මත්ස්‍ය බොකු | 2 | 3 | 2 | 2 | -5.1 | 0.00% |
| හක් ගෙඩි හා සිප්පි කටු | 325 | 286 | 343 | 289 | -15.8 | 1.70% |
| මත්ස්‍ය ආහාර | 13,229 | 16,919 | 18,653 | 11,807 | -36.7 | 67.60% |
| වෙනත් | 370 | 519 | 515 | 529 | 2.7 | 3.00% |
| එකතුව | 18,631 | 23,910 | 26,320 | 17,461 | -33.7 | 100.00% |

මූලාශ්‍රය: ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, 2015

එසේම එම මත්ස්‍ය අපනයන වලින් ශ්‍රී ලංකාව රුපියල් මිලියන 24,716 ක ආදායමක් ලබා ගෙන ඇති අතර එය 2014 ලැබූ රුපියල් මිලියන 34,797 ක ආදායමට සාපේක්ෂව 29%ක හිඟයකි.

ශ්‍රී ලංකාවට මත්ස්‍ය නිෂ්පාදන ආනයනය කරන ප්‍රධාන රටවල් වන්නේ මාලදිවයින, ඉන්දියාව, ජපානය, පාකිස්ථානය ආදී රටවල්ය. එම රටවල් වලින් කරවල, ටින් මාළු, උම්බලකඩ, වියළි හාල්මැස්සන්, ජීවී මසුන් ආදිය ශ්‍රී ලංකාවට ආනයනය කරයි. ඒ අනුව 2015 වර්ෂය වන විට සම්පූර්ණ මත්ස්‍ය නිෂ්පාදන මෙට්‍රික් ටොන් 120,746ක් ලංකාවට ආනයනය කර ඇති අතර ඉන් වැඩිම අගයක් ගන්නේ ටින් මාළු ආනයනයයි.

වගුව 02: ආනයන මත්ස්‍ය නිෂ්පාදන ප්‍රමාණ (මෙට්‍රික් ටොන්)

| ද්‍රව්‍ය | 2012 | 2013 | 2014 | 2015 | වෙනස % 2015/2014 | මුළු ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| කරවල | 14,251 | 14,138 | 10,406 | 8,445 | -18.8 | 7.00% |
| වියළි හාල්මැස්සන් | 25,181 | 23,471 | 24,874 | 24,607 | -1.1 | 20.50% |
| උම්බලකඩ | 1,383 | 1,447 | 1,256 | 2,216 | 76.5 | 1.80% |
| ටින් මාළු | 18,859 | 21,835 | 19,591 | 49,016 | 150.2 | 40.80% |
| මත්ස්‍ය ආහාර | 9,699 | 15,844 | 21,095 | 33,867 | 60.5 | 28.20% |
| ජීවී මසුන් | 86 | 94 | 91 | 106 | 16.8 | 0.10% |
| වෙනත් | 1,953 | 1,571 | 1,399 | 1,787 | 27.7 | 1.50% |
| එකතුව | 71,413 | 78,401 | 78,712 | 120,046 | 52.5 | 100.00% |

මූලාශ්‍රය: ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, 2015

**ධීවර කර්මාන්තය හා දල දේශීය නිෂ්පාදිතය**

දල දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී එහි ප්‍රධාන සංරචකයන් වන්නේ කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශ ත්‍රිත්වයයි. එහිදී ධීවර අංශයේ නිෂ්පාදිතය කෘෂිකාර්මික අංශයේ උප සංරචකයක් ලෙෂ ගණනය කෙරේ. මෙහි මෑත කාලීන තත්වයන් මෙසේ විමසා බැලිය හැක. 2012 දී ශ්‍රී ලංකාවේ දල දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයෙන් වූ 11%ක දායකත්වයෙන් 1.3%ක දායකත්වයක් ලබා දී තිබුනේ ධීවර අංශයයි. එය 2015 වර්ෂය වන විට කෘෂිකාර්මික අංශයෙන් වූ 7.9%ක දායක්වයෙන් 1.4%ක දායකත්වයක් ධීවර අංශය ලබා දීම දක්වා වෙනස් වී තිබුනි. මෙම වෙනස්වීම පහත පරිදි විශ්ලේෂණය කල හැක.

වගුව 03: දල දේශීය නිෂ්පාදිතයට සමස්ථ කෘෂිකාර්මික අංශයෙන් හා ධීවර අංශයෙන් ලැබෙන දායකත්වය

| වර්ෂය | සමස්ථ කෘෂිකාර්මික අංශයේ දායකත්වය | ධීවර අංශයේ දායත්වය |
|---|---|---|
| 2012 | 11% | 1.3% |
| 2013 | 10.8% | 1.3% |
| 2014 | 10.1% | 1.3% |
| 2015 | 7.9% | 1.4% |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ධීවර අංශයේ සේවා නියුක්තිය

ශ්‍රී ලංකාවේ ධීවර අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සලකා බලන කල්හි ඊට දිගු ඉතිහාසයක් ඇති බව පෙනී යයි. මුල් කාලීනව කුල ක්‍රමය මත පදනම්ව ධීවර කටයුතු වල නියැලෙන්නන්ට තිබුනේ ඉහල පිළිගැනීමකි. ලංකාවේ පැවති ප්‍රධානම හා ඉහලම කුල යැයි සැලකෙන රදල හා ගොවිගම යන කුල වලින් පසුව ඉහල ගරුත්වයක් ලැබුනේ ධීවර කර්මාන්තයේ යෙදෙන කරාව කුලයටයි. නමුත් කාලයේ ඇවෑමෙන් ධීවර කර්මාන්තය කෙරේ මිනිසුන්ගේ ඇති ඇල්ම ක්‍රමයෙන් හීන වී ගොස් ඇති බවක් පෙනේ.

කරදිය ධීවර කර්මාන්තය ආශ්‍රිතව 2014 වර්ෂය වන විට පවුල් 190,780 ක කාන්තා හා පිරිමි ධීවර ශ්‍රමිකයන් 221,350ක් වාසය කරන බව ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය ප්‍රකාශ කරයි. මෑත කාලීන වශයෙන් බලන කල කර්මාන්තය ආශ්‍රිතව සේවා නියුක්තියේ ඉතා ඉහල වර්ධන තත්වයක් පෙන්නුම් නොකෙරෙන අතර යම් වර්ධන තත්වයක් පෙන්නුම් කරයි. මේ බොහෝ දෙනා අතර දැක ගත හැකි පොදු ලක්‍ෂණයක් ලෙස අඩු අධ්‍යාපන මට්ටම හඳුනාගත හැකි වන අතර, යම් අධ්‍යාපන මට්ටමකට හෝ ලඟා වූ තරුණයෙකු මෙම ක්‍ෂේත්‍රයේ නියැලීමට පසුබට වීමක් දැක ගත හැක. ක්‍ෂේත්‍රය ආශ්‍රිතව දැක ගැනීමට ලැබෙන ජීවිතයේ අනාරක්‍ෂිත භාවය, අඩු වැටුප් මට්ටම, ශ්‍රම සූක්‍ෂම කර්මාන්තයක් වීම නිසා අධිකව වෙහෙස වීමට සිදු වීම හා කර්මාන්තය කෙරෙහි සමාජයේ ඇති දැක්ම ආදී හේතූන් ඊට හේතු වන බව සිතිය හැක.

වගුව 04:ශ්‍රී ලංකාවේ ධීවර පවුල් හා ධීවර ශ්‍රමිකයන්

| වර්ෂය | ධීවර පවුල් | ධීවර ශ්‍රමිකයන් (කාන්තා හා පිරිමි) |
|---|---|---|
| 2011 | 187,340 | 215,430 |
| 2012 | 188,480 | 218,550 |
| 2013 | 190,210 | 219,400 |
| 2014 | 190,780 | 221,350 |

මූලාශ්‍රයඃ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

## ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ආශ්‍රිත ගැටළු

ශ්‍රී ලංකාවේ පොදුවේ සෑම කර්මාන්තයක් ආශ්‍රිතවම පාහේ දැක ගත හැකි වන පරිදි ධීවර කර්මාන්තය ආශ්‍රිතව ද යම් යම් ගැටළු කිහිපයක් හඳුනා ගත හැක. එහිදී මිරිදිය ධීවර කර්මාන්තය ආශ්‍රිතව ප්‍රධානව දැක ගත හැකි ගැටළුව වන්නේ වැසි අධික

කාල වලදී මාළු අස්වැන්න නෙලා ගැනීමට නොහැකි වීමයි. එය පූර්ණ කාලීනව මිරිදිය ධීවර කර්මාන්තයේ නියැලෙන්නන්ට හානිකර කරුණකි. එසේම නෙලා ගන්නා අස්වැන්න පවතින ඉල්ලුමට සාපේක්ෂව ප්‍රමාණවත් නොවන තත්වයක්ද මේ ආශ්‍රිතව දැක ගත හැක. මසුන් ඇල්ලීමට දමන දැල් කිඹුලන් විසින් කඩා දැමීම වැනි ගැටළු වලට ද මිරිදිය ධීවරයන්ට මුහුණ දීමට සිදු වී ඇත.

සාමාන්‍යයෙන් ධීවර අමාත්‍යාංශයෙන් වැව් වලට මත්ස්‍ය පැටවුන් මුදා හැරීම සිදු කරන අතර එසේ වැඩෙන පැටවුන් පසු කාලීනව අල්ලා ගැනීම මිරිදිය ධීවර කර්මාන්තයේදී සිදු වේ. නමුත් ඇතැම් විට ධීවර අමාත්‍යාංශයේ පවතින අකාර්යක්‍ෂම පිළිවෙත් නිසා නියමිත කාලයට මත්ස්‍ය පැටවුන් වැව් වලට මුදා හැරීමට ඔවුන් අපොහොසත් වේ. එවන් අවස්ථා වලදී ද ප්‍රමාණවත් අස්වැන්නක් නෙලා ගැනීමට හා ආදායම් තත්වය පවත්වා ගෙන යාමට ධීවරයන්ට නොහැකි වේ.

කරදිය ධීවර කර්මාන්තය ආශ්‍රයෙන් සලකා බැලීමේදී ප්‍රධාන වශයෙන් දැක ගත හැකි ගැටළුව වන්නේ ඉන්ධන මිල ඉහල යාමත් සමඟ මුහුදු මත්ස්‍ය නිෂ්පාදනයේ පිරිවැය ඉහල යාමයි. එසේම වෙනත් රටවල ධීවරයන් විසින් මුහුදු සීමා උල්ලංඝණය කරමින්, ශ්‍රී ලංකාවට අයත් මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම නිසා ද අපට අල්ලා ගත හැකි මත්ස්‍ය ප්‍රමාණය අඩු වන තත්වයක් දැක ගත හැක. ඊට අමතරව මුහුදු මංකොල්ලකෑම් වැනි තත්වයන් හා ජීවිත අවධානම, ධීවරයාට ලැබෙන කොටස අඩු වීම වැනි තත්ව හමුවේ ද, ධීවර වෘත්තිය කෙරේ සමාජයේ ඇති දැක්ම හේතුවෙන් ද ක්ෂේත්‍රයට ප්‍රවිශ්ට වීමට තරුණයන් මැලිකමක් දක්වයි.

න්‍යෂ්ටික අත්හදා බැලීම් සාගරයේ සිදු කිරීම, නැව් වලින් තෙල් කාන්දු වීම, නියමිත තාක්‍ෂණයට බැහැරව යමින් මසුන් දඩයම් කිරීම වැනි හේතූන් මත සාගර පරිසරයේ සමතුලනය බිඳ වැටීම නිසා මත්ස්‍ය සම්පත හීන වී ධීවර කර්මාන්තය ආශ්‍රිත රැකියා වල නියුක්ත අයගේ රැකියා අහිමි වීම වැනි තත්වයන් ද උද්ගත වී ඇත. එසේම ධීවර ගම්මාන සංචාරක ගම්මාන බවට පරිවර්තනය වීම ආරම්භ වීමත් සමඟම කර්මාන්තය තව දුරටත් පරිහානිය කරා ගොස් ඇත.

මෙසේ උද්ගත වී ඇති අනාගත අවිනිශ්චිතතාවය හා මන්දගාමී වර්ධනය මඟහරවා ගැනීම සඳහා රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගන්නා බවක් පෙන්නුම් කරයි. එහිදී ධීවරයන් සඳහා ඉන්ධන සහනාධාර දීම, කොළඹ මාළු වෙළඳසැල පැලියගොඩ ඉහල පහසුකම් වලින් යුක්තව නිර්මාණය කල නව වෙළඳසැළ වෙත මාරු කිරීම, මාළු වෙළඳසැල් ආශ්‍රිතව අයිස් කාමර, අයිස් නිෂ්පාදන පහසුකම් වර්ධනය කිරීම, මිරිදිය ධීවර කර්මාන්ත නඟා සිටුවීම සඳහා නව ප්‍රතිපත්ති සම්පාදනය වැනි පියවර ගැනීම ආදිය හඳුනා ගත හැක.

**සමාලෝචනය**

දෛනික ආහාර අවශ්‍යතාව මුල් කරගෙන ආරම්භ වුවා යැයි සැලකෙන ධීවර කර්මාන්තය අද වන විට ලෝකයේ බොහෝ රටවල ප්‍රධාන කර්මාන්තයක් බවට පත් වී ඇත. දූපතක් වශයෙන් ශ්‍රී ලංකාව ද මුහුදු තීරය භාවිතා කරමින් කරදිය ධීවර කටයුතු හා අභ්‍යන්තර ජලාශ භාවිතා කරමින් මිරිදිය ධීවර කටයුතු ද කරගෙන යයි.

රටේ අති විශාල පිරිසකට රැකියා අවස්ථා සපයා දුන්නත් ක්ෂේත්‍රයේ පවතින විවිධ ගැටළු හමුවේ ධීවරයන් බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දෙමින් කර්මාන්තය ඉදිරියට ගෙන යන බවක් පෙන්නුම් කෙරේ. නමුත් එය වර්ධනීය තත්වයක් නොවන අතර දක්නට ලැබෙන්නේ මන්දගාමී බවකි. මෙම තත්වය මඟ හැරීමට රජයන් විසින් යම් යම් පියවරයන් ගත්තද රට වට කොට ගත් ඉන්දියන් සාගරයෙන් උපරිම ඵල නෙලා ගැනීමට තරම් ඒවා ප්‍රමාණවත් නොවන බවක් පෙනේ. මත්ස්‍ය නිෂ්පාදන ආශ්‍රිත ආනයන අඩු කර රට තුලම ඒවා නිෂ්පාදනය කර ගැනීමට හා අපනයන වර්ධනය කර ගැනීමට තව තවත් උත්සුක විය යුතු බව මේ අනුව නිගමනය කල හැක.

**ආශ්‍රිත ග්‍රන්ථ**

හේරත්, ඩබ්ලිව්. ඩබ්ලිව්. සහ සේනාරත්න, ආර්. (2011) "බහුදින ධීවර කර්මාන්තය පිළිබඳ සමාජ ආර්ථික විශ්ලේෂණයක්", සී/ස සර්වෝදය විශ්වලේඛා පුද්ගලික සමාගම.

දයානන්ද පී. එම්. (2007) "සාම්ප්‍රදායික ධීවර කර්මාන්තය", දයානි ගොඩගේ, 479, මාතර පාර, පැලැන, වැලිගම.

අපේ උරුමය (Our Inheritance), "ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය හා මත්ස්‍ය වගාව", http://www.ourinheritancesl.blogspot. com , viewed on 7th October 2016.

Department of Fisheries and Aquatic Resources, http://fisheriesdept.gov.lk, viewed on 11th October 2016.

Food and Agriculture Organization of the United Nations, "The State of World Fisheries and Aquaculture 2016"

ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව 2012

ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව 2013

ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව 2014

ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව 2015